# Abstract No 52

## සංස්කෘත උපදේශ සාහිත්‍යයේ නිරූපිත කාන්තාවගේ ස්වභාවය; හිතෝපදේශය ඇසුරින් කෙරෙන විමර්ශනයක්.

**පූජ්‍ය කරඳගොල්ලේ සෝභිත හිමි**
උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
sksobhitha@gmail.com

සංස්කෘත උපදේශ සාහිත්‍යයේ අන්තර්ගත හිතෝපදේශය, රාජනීති ඉගැන්වීම සඳහා රචිත ග්‍රන්ථයකි. සමාජයේ ජීවත් වන මිනිසුන්ගේ විවිධ ගති ලක්ෂණ ගෙනහැර දක්වමින් එය රචනා කොට ඇත. මිනිසුන්ගේ කපටිකම්, ලෝභකම්, අනුචණ ක්‍රියාවන්, පහත් ආශාවන්, වැරදි හැසිරීම් ඈ සියලු මානුෂීය හැසිරීම් පිළිබඳ විස්තර කර දක්වයි. ඒ සඳහා බොහෝ සෙයින් උපයෝගී කොටගෙන ඇත්තේ සත්ව චරිතයි. ඒ අතර ස්ත්‍රීන්ගේ විවිධ වූ චපල ස්වභාවයන්, පහත් ආශාවන්, කාමුක භාවයන් මෙන්ම ඇයගේ මානුෂීය ගුණාංගයන් හා බුද්ධිමත්භාවය ගෙනහැර දැක්වීමට ද හිතෝපදේශ කතුවරයා අමතක කොට නැත. එහි ඇති සුවිශේෂත්වය වන්නේ කතුවරයා අනෙකුත් මිනිස් ගුණාගුණ දැක්වීමට තිරිසන් සත්වයන්ගේ චරිත ඇතුළත් කථා භාවිත කොට ඇතත් ස්ත්‍රීන්ගේ චපලභාවයන් හා ඇයගේ වැරදි හැසිරීම් දැක්වීම සඳහා සත්ව චරිත මෙන්ම ස්ත්‍රී චරිතයන් භාවිත කොට තිබීමයි. හිතෝපදේශයේ අනතර්ගත වී ඇති කථාවන්ට අනුව ස්ත්‍රියගේ කාමුකත්වය, චපලභාවය, මෙන්ම ස්ථානෝචිත ප්‍රඥාව, සබුද්ධිකභාවය, ඉවසීම හා දරා ගැනීමේ හැකියාව ආදිය පිළිබඳ තොරතුරු මෙන්ම ස්ත්‍රී චර්යාවෙහි විෂමතා අනාවරණය කරයි. ස්ත්‍රීන් සටකපට බවත් රතියෙහි බෙහෙවින් ඇලුම් කරන බවත් බොහෝවිට කියවේ. හිතෝපදේශයෙහි ස්ත්‍රීන්ගේ එබඳු විෂම චර්යාවන් සටහන් වන කථා රාශියකි. වානර- ඝණ්ඨා- කුට්ටිනී පිළිබඳ කථාවෙහි එන කුට්ටිනිය ද, කන්දර්පකේතු - ගොපලු බිරිය- දූතිය හා තවුසා පිළිබඳ කථාවෙහි එන ගොපලු බිරිය හා දූතිය ද, ගොපලු ලිය ගම්මුලාදෑනි සහ ඔහුගේ පුතා යන මොවුන් පිළිබඳ කථාවේ ගොපලු ලිය ද මහලු වෙළෙන්දා සහ තරුණිය පිළිබඳ කථාවේ තරුණිය ද රජකුමරා වෙළඳ පුත්‍රයා සහ ඔහුගේ බිරිඳ පිළිබඳ කථාවේ වෙළඳ බිරිඳ ද ස්ත්‍රී චරිතයන්හි විවිධ විෂමතාවන් අනාවරණය කරති. මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් හිතෝපදේශයේ නිරූපිත ස්ත්‍රියගේ ස්වභාවයන් හා තත් ස්වභාවයන් ගෙනහැර පෑමෙන් ලබාදීමට උත්සුක වන උපදේශයන් පිළිබඳ අධ්‍යයනය කරන අතර තත් උපදේශයන්ගේ කාලීන වැදගත්කම මෙන් ම එය සමාජ ප්‍රගමනය උදෙසා භාවිත කරගත හැකි ආකාරය පිළිබඳව විමර්ශනය කෙරේ.

**ප්‍රමුඛ පදඃ** හිතෝපදේශය, උපදේශ, ස්ත්‍රී ස්වභාව